# ගම්පහ ප්‍රාදේශීය සභාව

## 2025 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

2025 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවාවන් සැපයීම සඳහා මෙම ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි වීමට අපේක්ෂා කරන පිළිගත් නිෂ්පාදකයින් හා සැපයුම්කරුවන් ගෙන් පහත සඳහන් කොන්දේසි වලට යටත්ව 2025.02.28 දින දක්වා මවිසින් අයදුම්පත් භාරගනු ලැබේ.

1. සැපයුම්කරුවන්, සේවා සපයන්නන් හා කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි වීමට අපේක්ෂා කරන අය විසින් පහත සඳහන් විස්තරද ඇතුලත්ව සකස් කරගත් අයදුම්පත් 2025.02.28 දින හෝ ඊට ප්‍රථම "ලේකම් හා ගම්පහ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී, ගම්පහ ප්‍රාදේශීය සභාව, මිරිස්වත්ත, මුදුන්ගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ලැබෙන සේ එවිය හැකිය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2025" යනුවෙන් සඳහන් කළ යුතුය.

    I. භාණ්ඩ / සේවා සැපයුම්කරුවන්ගේ නම හා ලිපිනය
    II. දුරකථන / ෆැක්ස් අංකය, ඊමේල් ලිපිනය
    III. ලියාපදිංචිය අපේක්ෂා කරන සැපයුම් / සේවාවේ අංකය හා නම (උපලේඛනය අනුව)
    IV. ව්‍යාපාර වෙළඳ නාමය හා ලිපිනය
    V. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය (ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය)
    VI. පළපුරුද්ද පිළිබඳ විස්තර
    VII. ඉදිකිරීම් හා අළුත්වැඩියා ක්ෂේත්‍රයේ ලියාපදිංචිය පිළිබඳ විස්තරය (එම සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

- **අපේක්ෂිත සැපයුම් හා සේවාවන් පිළිබඳ උපලේඛනය හා ආදර්ශ අයදුම්පත www.gampaha.ps.gov.lk වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය.**
- එක් එක් සැපයුම් හා සේවාවන් සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතුය.

2. පහත උපලේඛනයේ දක්වා ඇති ලියාපදිංචි ගාස්තුව මුදලින් හෝ "සභාපති, ගම්පහ ප්‍රාදේශීය සභාව" නමට ලියන ලද චෙක්පතක් මගින් හෝ ගෙවීම් කළ හැක. (මේ සඳහා මුදල් ඇණවුම් බාරගනු නොලැබේ)
3. බස්නාහිර පළාත තුල සිටින සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

2025.01.24 වන දින
ගම්පහ ප්‍රාදේශීය සභාවේ දීය

දුරකථන අංක 033 2222020

එස්.ඒ.එන්.පී.සුරවීර
ලේකම් හා ගම්පහ ප්‍රාදේශීය සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරී,
ගම්පහ ප්‍රාදේශීය සභාව.

## 2025 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කර ගත යුතු සැපයුම් අයිතමයන් හා ඒ සඳහා අයකල යුතු ලියාපදිංචි ගාස්තු

| අයිතම අංකය | සැපයුම් අයිතමය | ලියාපදිංචි කිරීමේ ගාස්තුව |
|---|---|---|
| 3 | කාර්යාලීය රබර් මුද්‍රා | 1.000.00 |
| 10 | තීන්ත වර්ග හා ඊට සම්බන්ධ උපකරණ | 1.000.00 |
| 12 | වරිපනම් තහඩු ඇතුළු සියළුම අංක තහඩු | 1.000.00 |
| 18 | මල් පෝච්චි, පැළ වර්ග, පොහොර තෙල් ඇතුළු උද්‍යාන අලංකරණ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය | 1.000.00 |
| 27 | හැඳුනුම්පත් සකස් කිරීමේ ස්ථාන | 1.000.00 |
| | **සේවාවන්** | |
| 33 | භාෂා පරිවර්තන සේවා | 1.000.00 |
| 38 | කාර්යාලීය ලිබඩු හා වෙනත් භාණ්ඩ අළුත්වැඩියාව | 1.000.00 |
| 39 | කර්මාන්ත උපකරණ අළුත්වැඩියාව | 1.000.00 |
| 40 | ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු සහ නඩත්තු කටයුතු | 1.000.00 |
| 43 | ට්‍රැක්ටර් අළුත්වැඩියා සඳහා ගරාජ් | 1.000.00 |
| 44 | ට්‍රැක්ටර් සේවා කිරීම | 1.000.00 |
| 49 | ත්‍රිරෝද රථ අළුත්වැඩියාව හා සේවා කිරීම සහ අමතරකොටස් අලෙවිය | 1.000.00 |
| 50 | ත්‍රිරෝද රථ පින්තාරු කිරීමේ ගරාජ් | 1.000.00 |
| 52 | බෙලින් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම | 1,000.00 |
| 53 | කම්මල්කරුවන් | 1.000.00 |
| 54 | ටයර් ටියුබ් හා බැටරි අළුත්වැඩියාව | 1.000.00 |
| 55 | ටයර් නැවත පිරවීම සඳහා | 1.000.00 |
| 56 | පරණ පත්තර හා අබිලි ද්‍රව්‍ය මිළදී ගැනීම | 1.000.00 |
| 57 | උත්සව භාණ්ඩ (හට්, පුටු, ශබ්ද වාහිනී යන්ත්‍ර කුළියට ලබා දීම / අළුත්වැඩියාව හා අලෙවිය) | 1.000.00 |
| 60 | අනතුරුදායක ගස් හා ගස් අතු කපා ඉවත් කිරීම | 1.000.00 |

ලේකම් හා ගම්පහ ප්‍රාදේශීය සභාවේ බලතල,
කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
ගම්පහ ප්‍රාදේශීය සභාව.

**<u>ගම්පහ ප්‍රාදේශීය සභාව</u>**

**<u>2025 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම</u>**

**<u>ආදර්ශ අයදුම්පත්‍රය</u>**

| | | |
|---|---|---|
| 1. | භාණ්ඩ / සේවා සැපයුම්කරුගේ, කොන්ත්‍රාත්කරුගේ නම හා ලිපිනය | |
| 2. | දුරකථන අංකය<br><br>ෆැක්ස් අංකය<br><br>ඊමේල් ලිපිනය | |
| 3. | ලියාපදිංචිය අපේක්ෂා කරන සැපයුම් /සේවාවේ අංකය හා නම (උපලේඛනය අනුව) | |
| 4. | ණය පහසුකම් පිළිබඳ විස්තරය (ණය ප්‍රමාණය හා කාළය) | |
| 5. | ව්‍යාපාර වෙළඳ නාමය හා ලිපිනය | |
| 6. | ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය (ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය) | |
| 7. | පළපුරුද්ද (කලින් සැපයුම්/ සේවාවන් කල ආයතන) පිළිබඳ විස්තර | |
| 8. | ඉදිකිරීම් හා අළුත්වැඩියා ක්ෂේත්‍රයේ ලියාපදිංචිය පිළිබඳ විස්තරය (එම සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) | |

ඉහත සඳහන් විස්තර සත්‍ය වන බවත්, 2025.01.24 දිනැති පුවත්පත් දැන්වීමෙහි කොන්දේසි වලට එකඟ වන බවත් ප්‍රකාශ කරන අතර, ඔබ ආයතනයේ සැපයුම්කරුවකු / කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචි කර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

.............................................................................

දිනය: සැපයුම්කරු / කොන්ත්‍රාත්කරු ගේ අත්සන හා මුද්‍රාව